# ජනමාධ්‍ය අමාත්‍යාංශය
## வெகுசன ஊடக அமைச்சு
## MINISTRY OF MASS MEDIA

163, ඇසිදිසි මැදුර, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05.
163, அசிதிசி மெதுர, கிருலப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு - 05.
163, Asidisi Medura, Kirulapone Mawatha, Polhengoda, Colombo 05.


මගේ අංකය / எனது இல. / My No. } **MM/RTI/DEV/CER/2022** ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } **2022.08.17**

**චක්‍රලේඛ අංක - RTI /01/2022**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සභාපතිවරුන්
රජය සතු සමාගම් සහ රාජ්‍ය බැංකුවල සභාපතිවරුන්

**<u>2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත</u>**

**<u>ප්‍රකාරව විධිවිධාන ක්‍රියාත්මක කිරීම</u>**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනයේ14(අ) ව්‍යවස්ථාව මගින් තොරතුරු සඳහා ප්‍රවේශවීමේ අයිතිය මූලික අයිතියක් ලෙස පිළිගෙන ඇත. ඒ අනුව 14(අ) ව්‍යවස්ථාවේ 1,2,3 අනු ව්‍යවස්ථාව මගින් එකී අයිතිය සම්බන්ධ ව්‍යවස්ථාපිත තත්වය සඳහන්ව ඇත.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති තොරතුරු වෙත ප්‍රවේශවීමේ පුරවැසියා සතු මූලික අයිතිය බලාත්මක කිරීම සඳහා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත 2016 අගෝස්තු මස 04 වන දින සිට බලාත්මකව ඇත. එසේම ඊට අනුශාංගික නියෝග, රෙගුලාසි හා රීති අංක 2004/66 හා 2017/02/03 දරණ ගැසට් නිවේදනය සහ අංක 2006/43 හා 2017/02/17 දරණ ගැසට්පත්‍ර මගින් ප්‍රකාශිතය.

**02.** 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතෙහි 2 වන වගන්තිය මගින් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත සක්‍රීය ලෙස බලාත්මක කිරීමේ වගකීම මෙම අමාත්‍යාංශයට පැවරී ඇති අතර පනතේ සියලු විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම සියලුම පොදු අධිකාරීන් වෙත පවරා ඇත.

**03.** ඒ අනුව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඉටුකරන කාර්යයන් ශක්තිමත් කිරීම සඳහා ඔබ ආයතනය යටතේ ඇති සියළුම රාජ්‍ය ආයතන දැනුවත් කර පනත පියවරයන් ක්‍රියාත්මක කිරීමට ඔවුන් වෙත අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම සුදුසු වේ.

## I. ආයතනික අවශ්‍යතාවය පරිදි තොරතුරු නිලධාරී / නම්කළ නිලධාරී පත්කිරීම

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ **23 (1)** වගන්තිය ප්‍රකාරව සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් නිකුත් කර ඇති චක්‍රලේඛ අංක **ආර්ටීඅයි/01/2016** අනුව සෑම පොදු අධිකාරියක් විසින්ම තොරතුරු නිලධාරීන් සහ නම්කළ නිලධාරීන් පත්කිරීම කළ යුතු වේ.

**(අ)** 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අදාළ 2017 පෙබරවාරි 03 වැනි දිනැති 2004/66 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝග අංක 21 (3 ) වගන්තිය පරිදි "තොරතුරු නිලධාරියෙකු සිය රාජකාරී සඳහා නොපැමිණෙන අවස්ථාවල දී එකී රාජකාරී සඳහා යෝග්‍ය විකල්ප විධිවිධාන යෙදීම පොදු අධිකාරියක ප්‍රධාන විධායක නිලධාරියා විසින් කළ යුතු වන්නේය ". තොරතුරු නිලධාරියා සහ නම්කළ නිලධාරියාට අමතරව විකල්ප විධිවිධානයක් ලෙස විකල්ප තොරතුරු නිලධාරියෙක් පත්කළ හැකිය. එමෙන්ම මේ විෂය සම්බන්ධව ස්ථිර පදනමින් විෂය නිලධාරියෙකු පත්කළ යුතුය. මෙතෙක් තොරතුරු නිලධාරීන් සහ විකල්ප නිලධාරීන් වෙත විධිමත් පත්වීම් ලිපියක් නිකුත් කර නැත්තේ නම් ඒ සඳහා කටයුතු කළ යුතුය. තොරතුරු නිලධාරී සඳහා රාජකාරී පැවරීම කළ යුතුය. (ඇමිණුම 01 )

**(ආ)** ඔබ ආයතනයේ තොරතුරු නිලධාරී හෝ නම්කළ නිලධාරීන් හෝ විකල්ප තොරතුරු නිලධාරීන් වෙනස් වූ වහාම අදාළ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත දැනුම් දීම RTI 12 ආකෘතිය මඟින් යොමු කළ යුතු වේ. ( ඇමුණුම 02 )

**(ඇ)** තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත හා සම්බන්ධව කටයුතු කරන නිලධාරීන් පහසුවෙන් සම්බන්ධ කර ගැනීමට විෂය නිලධාරියකුගේ විස්තර ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙත එවීමට කටයුතු කරන්න. මෙම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ විධිවිධාන නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් සෑම පොදු අධිකාරියක් සඳහාම සම්බන්ධීකරණ නිලධාරියකු නම්කර ගැනීමට අදහස් කෙරේ. ඔබ අධිකාරියේ, අමාත්‍යාංශයේ සම්බන්ධීකරණ නිලධාරියා වශයෙන් තොරතුරු නිලධාරී නම්කර එවීම වඩාත් සුදුසු වේ. එම නිලධාරියාගේ රාජකාරී ලැයිස්තුවට ද මෙම වගකීම ඇතුළත් කිරීමට කටයුතු කරන්න.

**(ඈ)** 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 23 (3) වගන්තිය ප්‍රකාරව "තොරතුරු නිලධාරියා විසින්, මෙම පනත යටතේ ඔහු හෝ ඇය වෙත පවරන ලද කාර්යය නිසි පරිදි ඉටු කිරීම සඳහා ඔහු හෝ ඇය විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි වෙනත් යම් නිලධරයකුගේ සහය ලබා ගත හැකි අතර, එසේ එවැනි නිලධරයකුගෙන් සහය ඉල්ලා සිටින විට, එම සහය ලබාදීම ඒ නිලධාරියාගේ කාර්යය වන්නේය" යන වගන්තිය යටතේ දන්වා ඇති නියමයට අනුව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ කළ යුතු කටයුතු සම්බන්ධයෙන් තොරතුරු නිලධාරියාට / විකල්ප තොරතුරු නිලධාරියාට / නම්කළ නිලධාරියාට සහය වීම සෑම නිලධාරියකුගේම රාජකාරී ලැයිස්තුවට ඇතුළත් කරන ලෙස ඉල්ලමි. එම වගකීම රාජකාරී ලැයිස්තුවට ඇතුළත් කිරීම හරහා සියලුම රජයේ නිලධාරීන්ට පනතේ අරමුණු සාක්ෂාත් කරගැනීමට සහ නිලධාරීන් බලගැන්වීමට හැකියාව ලැබේ. රාජකාරී ලැයිස්තුවට ඇතුළත් කිරීමේ දී " 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු නිලධාරියාට, නම්කළ නිලධාරියාට සහය වීම" ලෙස ඇතුළත් කිරීම සුදුසුය.

**(ඉ)** ඔබ ආයතනයේ තොරතුරු නිලධාරී හෝ විෂය නිලධාරී, විකල්ප නිලධාරී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳව විධිමත් පුහුණුවක් ලබා නොමැති නම් ජනමාධ්‍ය අමාත්‍යාංශය වෙතින් හෝ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව වෙත ඒ සම්බන්ධව නොපමාව දැනුම් දීම සිදුකර අදාළ පුහුණුවක් සඳහා යොමු කළ හැකිය.

**(ඊ)** ඔබගේ කාර්යය මණ්ඩල සාකච්ඡාවල දී සහ ප්‍රගති සමාලෝචන රැස්වීම්වල දී තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතට අදාළ කාර්යන් සම්බන්ධව සහ මෙම පනතේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් න්‍යාය පත්‍රයේ විෂයක් ලෙස ඇතුළත් කර සාකච්ඡා කරන ලෙසට යෝජනා කරමි.

**(උ)** අවම වශයෙන් වසරකට එක්වරක් හෝ සුදුසු නිලධාරියකු මඟින් තොරතුරු අයිතිවාසිකම් පනත සම්බන්ධයෙන් ආයතනික නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පැවැත්වීම වඩාත් සුදුසු වේ.

**(ඌ)** තොරතුරු නිලධාරීන් හා නම්කළ නිලධාරීන්ට පමණක් නොව තොරතුරු දරා සිටින නිලධාරීන්ට, තොරතුරු තාක්ෂණික අංශයේ නිලධාරීන්ට මහජන සබඳතා අංශයේ නිලධාරීන්ට, දුරකථන ක්‍රියාකරුවන්ට තොරතුරු අයිතිවාසිකම් පනතේ ක්‍රියාකාරීත්වයට අදාළ කරුණු (අදාළ පරිදි ) රාජකාරී ලැයිස්තුවේ වැඩ විෂයක් ලෙස ඇතුළු කිරීම හා කාර්යය සාධන ඇගයීම්වල දී ද මෙම රාජකාරී ඇගයීමට ලක්කිරීම මඟින් මෙම කාර්යය නිලධාරීන්ගේ අවධානයට ලක්කිරීම අදහස් කෙරේ.

**II. අදාළ නිලධාරීන්ගේ විස්තරය ඔබ ආයතන පරිශ්‍රයේ ප්‍රදර්ශනය කිරීම**

2017 පෙබරවාරි 03 වන දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ නියෝග අංක 3.1 අනුව පහත ක්‍රමවේද අනුගමනය කළ හැක.

**(අ )** සෑම පොදු අධිකාරියක්ම නියෝග අංක 3.1 **සෑම පොදු අධිකාරියකම සිය අධිකාරියෙහි පරිපාලනය යටතේ පවත්නා සෑම කාර්යාලයකම පහත දැක්වෙන ආකෘතිය පරිදි නිවේදනයක් ප්‍රකටව පෙනෙන ස්ථානයක සිංහල හා දෙමළ භාෂා මාධ්‍යයෙන් ප්‍රදර්ශනය කළ යුතු වේ.** ඒ අනුව කටයුතු කිරීම සියළුම පොදු අධිකාරීන්ගේ වගකීම වන බැවින් එම නියෝගයේ සඳහන් කරුණු ඉටුකිරීම සඳහා ඔබ ආයතනය බැඳී ඇත. මේ සඳහා අදාළ ආකෘතිය අනුව හෝ පොදු අධිකාරිය සහ අනෙකුත් කාර්යාලවල, ස්ථිර දැන්වීම් පුවරුවක, නිල වෙබ් අඩවිය තුළ සිංහල සහ දමිළ මාධ්‍යයෙන් ප්‍රදර්ශනය කළ යුතු අතර යාවත්කාලීන කර පවත්වාගෙන යාම කළ යුතුයි. එම විස්තර ආයතනය ඉදිරියේ ස්ථාවරව ප්‍රදර්ශනය කිරීමෙන් මහජනතාවට වඩාත් පහසු සේවාවක් සැලසිය හැකිවෙයි.

**(ආ)** තොරතුරු නිලධාරියාගේ නම සහ ස්ථිර තනතුර සමඟ **"තොරතුරු නිලධාරී "** ලෙස නාමකරණය කරන ලෙසත් එම පරිශ්‍රය **තොරතුරු දැනගැනීමේ ඒකකය** ලෙසත් නම්කිරීම සුදුසුය. ආයතන පරිශ්‍රයේ ඊට අදාළ ලිපිගොනු පවත්වා ගෙනයාමට සහ සාර්ථක මහජන සම්බන්ධතාවක් ගොඩනැගීම සහ පුරවැසියා බලගැන්වීම උදෙසා එම ඒකකය ඉතා වැදගත් වේ.

**(ඇ)** තොරතුරු නිලධාරී සම්බන්ධ කරගත හැකි ස්ථාවර දුරකථන අංකය අදාළ ස්ථානවල ප්‍රසිද්ධ කළ යුතුවේ. තොරතුරු නිලධාරීගේ ස්ථාවර දුරකථන අංකය යෙදීම වඩාත් සුදුසුය. එක් පොදු අධිකාරියක් සඳහා තොරතුරු නිලධාරීන් කිහිප දෙනෙකු පත්කර ඇති අවස්ථාවක දී මූලස්ථානයේ සිටින ජ්‍යෙෂ්ඨ තොරතුරු නිලධාරියාට මෙම ඒකකය පැවරීම සුදුසු වේ.

**(ඇ)** එම නිලධාරීන් සම්බන්ධ කර ගත හැකි දුරකථන අංක හා වෙනත් තොරතුරු ප්‍රසිද්ධ කළ යුතු අතර අදාළ නිලධාරියා සිටින ස්ථානය බාහිරින් පැමිණෙන අයකුට පහසුවෙන් දැනගත හැකි පරිදි දිශානුගත කිරීමට කටයුතු කළ යුතුවේ.

## III. ලේඛන විද්‍යුත් ක්‍රමවේදයකින් සුරක්ෂිත කිරීම

**(අ)** පනතේ 07 (5) වගන්තිය ප්‍රකාරව ලේඛන පවත්වාගෙන යාම සඳහා සුදුසු වැඩපිළිවෙලක් සකස් කර ගත යුතුවේ.
**(ආ)** ලේඛන කළමණාකරණය සම්බන්ධව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවෙන් විමසා අදාළ මාර්ගෝපදේශ ලබාගත හැකිය .
**(ඇ)** සෑම පොදු අධිකාරියක් විසින්ම පවත්වාගෙන යනු ලබන ලේඛන, සාධාරණ කාලයක් ඇතුළත ස්වකීය සියලු වාර්තා විද්‍යුත් මාධ්‍යයකින් ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය.

**(ඇ)** මේ පනතේ යටතේ ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක විෂය වස්තුව වන්නා වූ කිසිදු වාර්තාවක් හෝ තොරතුරක්, එම ඉල්ලීම හෝ එම ඉල්ලීමට අදාළ යම් අභියාචනයක් විභාග වන අතරතුර දී හෝ අධිකරණ කටයුත්තක් පවතින කාලය තුළ දී විනාශ නොකළ යුතුය.

**(ඉ )** පනතේ (05) 2 වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, එය නොසලකමින් සෑම පොදු අධිකාරියක් විසින්ම සම්පත්වල පැවතීමට යටත්ව, සාධාරණ කාලයක් ස්වකීය සියලු වාර්තා විද්‍යුත් ලේඛනාකෘතියෙන් ආරක්ෂා කර තැබීම සඳහා උත්සුක විය යුතුය.

## IV. වාර්ෂික වාර්තා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිෂන් සභාව වෙත යොමු කිරීම

**( අ)** තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 08 හා 10 වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තා සහ අර්ධ වාර්ෂික වාර්තා ඔබ ආයතනයේ අදාළ වර්ෂයන් තුළ දී ලැබුණු තොරතුරු ඉල්ලීමට අදාළ විස්තර වාර්තාවන් සහ ස්වකීය නිල වෙබ් අඩවියේ පළ කළ යුතුය.

**(ආ)** තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව සෑම පොදු අධිකාරියක් විසින්ම එකී වාර්තා අදාළ වන වර්ෂයට ඉක්බිතිව එළඹෙන වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පෙර තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවට නොපමාව යොමු කිරීමට කටයුතු කරන්න.

**V. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්බන්ධ පුහුණු උපදේශක සංචිතයේ පුහුණු උපදේශක නිලධාරීන් නිදහස් කිරීම**

**(අ)** දැනට තොරතුරු අයිතිවාසිකම් පනත හා සම්බන්ධ පුහුණු සංචිතයේ පුහුණුව ලැබූ නිලධාරියෙකු ඔබ ආයතනය තුළ සිටී නම් එම පුහුණු නිලධාරියා අප ඉදිරියේදී සංවිධානය කරනු ලබන තොරතුරු නිලධාරීන් හෝ අනෙකුත් රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා අදාළ දිනවලදී නිදහස් කිරීමට ඉල්ලා සිටිමි. එමගින් එසේ පුහුණු සංචිතයේ සිටින යම් නිලධාරියකු ස්ථානමාරු ලැබ යන්නේ නම් එම ස්ථාන මාරුව ලැබූ විගස එම විස්තරය සහ පොදු අධිකාරියේ විස්තර මෙම අමාත්‍යාංශයට එවීමට කටයුතු කළ යුතුවේ.(දැනට මෙම අමාත්‍යාංශයේ යටතේ පුහුණුව ලැබූ පුහුණු සංචිතය තුළ සිටින නිලධාරී ලැයිස්තුව අපගේ www.rti.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරගත හැක )

**VI. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතේ විධිවිධාන ක්‍රියාත්මක නොකරන නිලධාරීන් සම්බන්ධව පනතේ 38 ,39 වගන්ති වලින් දක්වා ඇති පරිදි තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් කොමිෂන් සභාව මගින් නිර්දේශ කරනු ලබන විනය පියවර හා අධිකරණ කටයුතු සම්බන්ධයෙන් සියලුම නිලධාරීන් දැනුවත් කිරීම සුදුසු වේ.**

**VII. මෙම චක්‍රලේඛය තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ එකඟතාවය පරිදි නිකුත් කොට ඇත.**

ඒ අනුව මෙම පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත සඳහන් පරිදි කටයුතු යොදා සහය වන ලෙස ඔබ වෙත කාරුණිකව දැනුම් දෙමි.

**ඊ.පී.කේ.අනුෂ පැල්පිට**
ලේකම්
ජනමාධ්‍ය අමාත්‍යාංශය

<u>වැඩිදුර විස්තර සඳහා</u>

- ඊ.එම්.එස්.බී.ජයසුන්දර මහතා ,අතිරේක ලේකම් (සංවර්ධන , සැලසුම් හා තොරතුරු) (011-2515700)
- එස්.ඩී.එන්.එස්.ජයසේන මිය , ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (තොරතුරු ) (011-2515700)
- යූ.එච්.එස්.එන්.ධම්මික මහතා , සංවර්ධන නිලධාරී, ( RTI ) (011-2515700)
- ඩී.එම්.ලක්ෂ්මි දිව්‍යාංජලී හරිස්චන්ද්‍ර මෙය , සංවර්ධන නිලධාරී, ( RTI ) (011-2515700)
- අමිතා රතුගමගේ මෙය , සංවර්ධන නිලධාරී, ( RTI ) (011-2515700)

**ඇමුණුම 01**

.....................................................................

.....................................................................

.....................................................................

**<u>2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත යටතේ (ආයතනයේ නම ) තොරතුරු නිලධාරීන් පත්කිරීම</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14 (අ) ව්‍යවස්ථාව මඟින් තහවුරු කර ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීම සඳහා පුරවැසියන් සතු මූලික අයිතිය බලාත්මක කිරීම උදෙසා 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත 2016 අගෝස්තු මස 04 දින සිට බලාත්මකව ඇති අතර, පනතේ සියලු විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ වගකීම පොදු අධිකාරීන් වෙත පවරා ඇත. ඒ අනුව එම කාර්යය ඉටුකිරීම සඳහා පොදු අධිකාරිය විසින් තොරතුරු නිලධාරීන් ලෙස නැවත එම රාජකාරී පැවරේ.

**02.** ඒ අනුව ඔබගේ නිත්‍ය රාජකාරිවලට අමතරව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනතෙහි 23 වගන්තිය ප්‍රකාරව හා 2017.02.03 දිනැති 2004/66 දරණ ගැසට් පත්‍රයේ නියෝග අංක 21 අනුව (ආයතනයේ නම ) තොරතුරු නිලධාරී ලෙස ඔබව පත්කරමි.

**03.** 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත හා 2017.02.03 දිනැති 2004 /66 දරණ නියෝග ඇතුළත් ගැසට්පත්‍රය හා 2017.02.17 දිනැති අංක 2006 /43 ගැසට් නිවේදනයේ විධිවිධාන අනුව ඔබ විසින් රාජකාරි ඉටුකළ යුතුවේ.

<u>තනතුරට පැවරෙන වගකීම්</u>

- **I.** 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූලව ආයතනයෙහි අභ්‍යන්තර කාර්යය පටිපාටිය සංවිධානය කරගනිමින් තොරතුරු ඉල්ලීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යාම
- **II.** 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 08 සිට 10 දක්වා වන වගන්තිවල විධිවිධාන ප්‍රකාර තොරතුරු හෙළිදරව් කිරීම අමාත්‍යාංශය / ආයතනය විසින් සිදුකරන ලබන බවට සහතිකවීම
- **III.** පනතේ 07 වන වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් එහි වාර්තා මැනවින් පවත්වා වන බවට සහතික වීම
- **IV.** ආයතනය සම්බන්ධව තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ලැබෙන පැමිණිලි සම්බන්ධව පූර්ණ හා විධිමත් සහයෝගයෙන් යුතුව ක්‍රියාකරන බව සහතික වීම
- **V.** පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව ප්‍රකාශයට පත්කළ යුතු අදාළ වාර්තා ප්‍රකාශයට පත්කරන බවට සහතික වීම
- **VI.** ආයතනය සතු වගකීම් නිසිලෙස ඉටුකිරීමට හා 2004 /66 දරණ නියෝග යටතේ නියම කර ඇති ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීමට අදාළ ක්‍රියාකාරී සැලැසුම් සම්පාදනය කිරීම සිදුකළ යුතු වේ.

**<u>තනතුරට අදාළ රාජකාරී</u>**

I. පනතේ 23 (2) අනුව ඔබ විසින් (ආයතනයේ නම ) ලැබෙන සියලුම තොරතුරු ඉල්ලීම් සම්බන්ධව ක්‍රියාකළ යුතුවේ.

II. පනතේ 24 (1)(2)(3)(4) උප වගන්ති මඟින් දක්වා ඇති ක්‍රියාපටිපාටියට අනුව හා 2017.02.03 දිනැති 2004/66 දරණ ගැසට් පත්‍රයේ විධිවිධානවලට යටත්ව තොරතුරු ඉල්ලීම් සම්බන්ධව කටයුතු කළ යුතුය.

III. පනතේ 24 වගන්තිය යටතේ ඉදිරිපත් වන ඉල්ලීම් සම්බන්ධව පනතේ 25 වන වගන්තිය (1)(2)(3)(4)(5)(6) උපවගන්ති මඟින් දක්වා ඇති ආකාරයට ලැබෙන තොරතුරු ඉල්ලීම් සම්බන්ධව ක්‍රියාකළ යුතුය.

IV. පනතේ 05 වන වගන්තිය මඟින් දක්වා ඇති ව්‍යතිරේක හැර පුරවැසියකුට තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිය ප්‍රතික්ෂේප නොකළ යුතුය.

V. පුරවැසියන් වෙත තොරතුරු ලබාදීමේදී පනතේ 27 ,28 හා 29 වගන්ති කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමුකර ඒ අනුව කටයුතු කළ යුතුය.

VI. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන අනුව ක්‍රියා නොකිරීම පනතේ 38 වගන්තිය අනුව විනය ක්‍රියාමාර්ග ගැනීමට හා පනතේ 39 වන වගන්තියේ (1) අ සිට ළ දක්වා වැරදි සම්බන්ධව අධිකරණමය දණ්ඩනයට ද යටත් විය හැකි බව පොදු අධිකාරියේ තොරතුරු පාලනභාරය හෝ සන්තකය දරණ නිලධාරීන් දැනුවත් කළ යුතුය.

VII. පනතේ 23 (3) වගන්තිය අනුව 2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පනත සම්බන්ධව කාර්යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය නිලධාරියකුගේ සහය ලබා ගැනීමට ඔබට හැකියාව ඇත.

VIII. 2017.02.03 දිනැති 2004 / 66 දරණ ගැසට් පත්‍රයේ නියෝග අංක 21 (4) අනුව ඔබගේ සාමාන්‍ය රාජකාරිවලට වඩා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් රාජකාරී සඳහා ප්‍රමුඛතාවය ලබාදිය යුතුවේ.

IX. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාවේ පවත්වනු ලබන අභියාචනා විභාගයන් කිරීමේදී පූර්ණ සහය දැක්විය යුතු අතර , කොමිෂන් සභා නියෝග අනුව කටයුතු කළ යුතුවේ.

ආයතන ප්‍රධානියාගේ නම සහ අත්සන

ඇමුණුම 02

RTI 12

## නම්කල නිලධාරීන් හා තොරතුරු නිලධාරීන් සම්බන්ධ විස්තර වාර්තාව

| ආයතනයේ දෙපාර්තමේන්තුවේ/කාර්යාලයේ නම | නම්කල නිලධාරියා ද තොරතුරු නිලධාරියා ද යන වග | නම මයා/මිය | තනතුර | රාජකාරි ලිපිනය | දුරකථන අංකය | ෆැක්ස්/ඊමේල් |
| --- | --- | --- | --- | --- | --- | --- |
| | | | | | | |